ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு
24/4, Castle street , Colombo - 08.

මගේ අංකය / எனது இல / My No: DDD/HO/13/SW/06/09

ඔබේ අංකය / உமது இல / Your No: ...........

දිනය / திகதி / Date: 2014/12/29

දිවිනැගුම සහනාධාර චක්‍රලේඛ අංක **2014/14**

සියලුම කලාප දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරීන්,

**<u>2015 අයවැය යෝජනාව අනුව දිවිනැගුම සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>**

**2015 අයවැය යෝජනා අනුව දිවිනැගුම සහනාධාර වැඩිකර ගෙවීම සම්බන්ධයෙන් ඔබ වෙත නිකුත් කල මගේ සමාංක හා 2014/12/22 දිනැති 2015/1 චක්‍රලේඛය මෙයින් අවලංගු කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.**

2015 වර්ෂයේ අයවැය යෝජනා අනුව වැඩිකරන ලද දිවිනැගුම සහනාධාර වටිනාකම් ප්‍රතිලාභීන්ට ගෙවීම 2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ යුතුය.

**02.** ඒ අනුව දැනටමත් දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභීන් සඳහා පහත සඳහන් පරිදි සහනාධාර දීමනා ලබා දීමට කටයුතු කළ යුතුය.

| පවුලේ සාමාජික සංඛ්‍යාව | සහනාධාර දීමනාව බෙදීයන ආකාරය | | | | |
|---|---|---|---|---|---|
| | නව සහනාධාර වටිනාකම රු. | අනිවාර්ය ඉතිරි කිරීම් රු. | සමාජ ආරක්ෂණය රු. | නිවාස ලොතරැයිය රු. | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල රු. |
| 4 හෝ 4 වැඩි | 3000/= | 300/= | 45/= | 10/= | 2645/= |
| 03 | 2000/= | 200/= | 45/= | 10/= | 1745/= |
| 03 අඩු | 1000/= | 100/= | 45/= | 10/= | 845/= |
| සවිබල ගැන්වූ පවුල් | 420/- | 365/- | 45/= | 10/= | - |

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/ Telephone: | 011-2669703 | 011-2678203 | 011-2669725 |
| ෆැක්ස්/ தொலைமடல்/ Fax: | 011-2669709 | 011-2669700 | 011-2669725 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | hrddivineguma@gmail.com | |

2.1 මෙම සහනාධාර වැඩසටහන යටතේ පෙර පරිදිම සමාජ ආරක්ෂණය, අනිවාර්ය ඉතුරුම්, නිවාස ලොතරැයි අරමුදල සඳහා මුදල් වෙන් කරන අතර, ඒ අනුව පහත උපදෙස් පිළිපැදිය යුතු වේ.

| | | | |
|---|---|---|---|
| 1) | සමාජ ආරක්ෂණය සඳහා | - | සෑම මසකම රු. 45/=ක මුදලක් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් සමාජ ආරක්ෂණ අරමුදල වෙත අදාළ මාසයේ 15වන දිනට ප්‍රථම ප්‍රේෂණය කළ යුතුය. |
| II) | නිවාස ලොතරැයිය සඳහා | - | සෑම මසකම රු. 10/=ක මුදලක් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් අදාළ මාසයේ 15 වන දිනට ප්‍රථම නිවාස ලොතරැයි අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතුය. |
| III) | අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා | - | වගුවේ දක්වා ඇති ආකාරයට සෑම මසකටම අදාළ අනිවාර්ය ඉතිරි කිරීම් හා ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල එකවර ගිණුමට ගිණුම්ගත කළ යුතු අතර, ප්‍රතිලාභියාට මුදල් ගෙවීමේදී අනිවාර්ය ඉතුරුව ලෙස සඳහන් මුදල රඳවාගෙන ඉතිරිය ගෙවීමට අවශ්‍ය විධිවිධාන සැළසිය යුතුයි. |
| IV | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල | - | ඉහත (III) හි පරිදි ගිණුම්ගත කළ පසු (අනිවාර්ය ඉතුරුම් මුදල හැර) මෙම මුදල ප්‍රතිලාභියාට ඕනෑම අවස්ථාවක ලබා ගත හැකිය. (මෙම මුදල් ගෙවීම සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් ප්‍රතිලාභීන් වෙත නිකුත් නො කළ යුතුය.) |

2.2 එසේම සියලුම දිවිනැගුම සහනාධාර ප්‍රතිලාභීන් සඳහා ඒ ඒ වටිනාකම්වලට අදාළව හිමිකම් පත්‍රයක් ලබාදීමට කටයුතු කළ යුතුය.

## 03. දිවිනැගුම ප්‍රජාමූල බැංකු වෙත මුදල් නිදහස් කිරීම.

3.1 ප්‍රතිලාභී ගිණුම් බැර කිරීම පිණිස දිවිනැගුම ප්‍රජා මූල බැංකු වෙත මුදල් නිදහස් කළ යුත්තේ ඔබ විසින් මාසිකව යාවත්කාලීන කරනු ලබන නාම ලේඛනය පදනම් කරගෙනය.

3.2 දිවිනැගුම ප්‍රතිලාභී නාම ලේඛන පිටපත් දෙකකින් සකස් කර එහි එක් පිටපතක් සමඟ අදාළ චෙක්පත දිවිනැගුම ප්‍රජාමූල බැංකුව වෙත සෑම මසකම පළමු සතිය තුළ යැවිය යුතුය.

3.3 සෑම මාසයක් සඳහාම දිවිනැගුම ප්‍රජාමූල බැංකුව වෙත මුදල් නිදහස් කිරීමට ප්‍රථම ඊට පෙර මාසයේ ප්‍රතිලාභී ගිණුම්වලට මුදල් ගිණුම්ගත කිරීම හා එසේ කිරීමට නොහැකි වූ ප්‍රතිලාභීන් පිළිබඳ වාර්තාවක් අදාළ මාසයේ 12 වන දිනට පෙර ලබා ගත යුතුය. ඒ අනුව, එසේ ගිණුම්ගත නොකළ ඉතිරි මුදල් ප්‍රමාණය ඉදුරාම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත සෑම මාසයකම 15 දිනට පෙර (කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත) ලබාදිය යුතුය.

3.4 2015 වර්ෂයේ සිට සෑම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරයෙකු වෙතම සහනාධාර සඳහා වන අක්මුදල් මාසයේ පළමු සතිය තුළ නිදහස් කරන බැවින් අක්මුදල් ලැබුණු විගස ගෙවීම් කිරීම සඳහා අදාළ තොරතුරු සමග වවුචර්පත් ගිණුම් අංශය වෙත කල්ඇතිව යොමු කිරීමට කටයුතු කළ යුතුය. සහනාධාර සඳහා වෙන්කරන අක්මුදල් එම කටයුත්ත සඳහා පමණක් යොදාගෙන අදාළ ගෙවීම් නිසි පරිදි අවසන් කිරීම සඳහා නිලධාරීන් වෙත උපදෙස් දිය යුතුය.

## 04. සහනාධාර ගිණුම්ගත කිරීම.

4.1 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභියා නමින් දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ ගිණුමක් තිබීම අනිවාර්ය වේ. ගිණුමක් නොමැති නම් නව ගිණුමක් ප්‍රතිලාභියා හෝ කලත්‍රයා වෙනුවෙන් ආරම්භ කළ යුතුය.

4.2 ප්‍රතිලාභී නාම ලේඛනයට අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකුව වෙත ලැබෙන මුදල් ඉතා කඩිනමින් ඔවුන්ගේ ගිණුම්වලට ගිණුම් ගතකර අවසන් කිරීමට උපදෙස් ලබා දිය යුතුය.

4.3 බැංකු මගින් මුදල් ගෙවනු ලබන සෑම විටම ප්‍රතිලාභියා විසින්ම පමණක් මෙම මුදල් ලබා ගන්නා බවට සහතික කරගත යුතු අතර, ඕනෑම අවස්ථාවක ඔවුන්ට තම ගිණුමෙන් මුදල් ලබා ගැනීමට හැකි විය යුතුය. කලත්‍රයා වෙත මුදල් ලබා දීම යෝග්‍ය යැයි ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරී විසින් තීරණය කරනු ලබන විශේෂ අවස්ථාවක දී ඔහුගේ අවසර පත්‍රයක් යටතේ එම මුදල මුදා හැරීම සිදු කළ හැක. එවන් අවස්ථාවල ඒ පිළිබඳ තොරතුරු මා වෙත වාර්තා කළ යුතුය.

4.4 යම් ප්‍රතිලාභියෙකු මේ වනවිටත් ගිණුමක් විවෘත කර ගැනීමට කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳව කරුණු සලකා බලා එම අයගේ ප්‍රතිලාභීත්වය අත්හිටුවීමට අවශ්‍ය කටයුතු කර, වහාම එම තොරතුරු මා වෙත වාර්තා කළ යුතුය.

4.5 ප්‍රතිලාභී නාම ලේඛන සංශෝධනය කිරීමේදී ප්‍රතිලාභ නිදහස් කිරීමත් සමඟ පළමු ගෙවීමේදී අදාළ බැංකු ගිණුම් පිළිබඳ විස්තර වාර්තාවක් දිවිනැගුම කළමනාකරු මගින් ඔබ වෙත ලබා ගෙන එහි පිටපතක් මා වෙත ලැබීමට සැලැස්විය යුතුය. (දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂට පිටපතක් සහිතව මා වෙත එවීමට කටයුතු කරන්න.)

4.6 අනිවාර්ය ඉතිරි කිරීම් සම්බන්ධයෙන් වැඩි දුරටත් පහත සඳහන් ආකාරයෙන් කටයුතු කළ යුතුය. එනම්, ප්‍රතිලාභියා වෙත එම මුදල් නිදහස් කළ හැක්කේ, ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරීගේ අනුමැතිය ඇතිව පහත සඳහන් අවශ්‍යතා මත පමණි.

- වයෝවෘද්ධ වූ විට (වයස අවුරුදු 60ට වැඩි වූ විට)
- හදිසි රෝගාබාධ අවස්ථාවන්වලදී වියදම් දන්වා අවශ්‍ය වියදම ලබා ගැනීමට, (ප්‍රතිලාභියා හෝ කලත්‍රයා හෝ දරුවෙකු)
- දරුවෙකුගේ උසස් අධ්‍යාපන කටයුත්තකට ගෙවීම් කිරීමට හා
- දිවි නැගුම ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජන අවශ්‍යතාවයක් ඉටුකර ගැනීමට

## 05. අක්මුදල් නිදහස් කිරීම.

5.1 සහනාධාර දීමනා ගෙවීම සඳහා අවශ්‍ය අක්මුදල් කලාප උපරිමය පදනම් කර ගනිමින් ප්‍රධාන කාර්යාලය විසින් කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල ගිණුම වෙත සෘජුවම ප්‍රේෂණය කරනු ලැබේ. කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් විසින් දිස්ත්‍රික්කයේ උපරිමය පදනම් කර ගනිමින් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂගේ ගිණුම වෙත අවශ්‍ය මුදල් නිදහස් කරනු ඇත. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් තම ගිණුමට මුදල් ලැබුණු වහාම ප්‍රාදේශීය කාර්යාලයේ උපරිමය පදනම් කර ගනිමින් අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය ප්‍රාදේශීය සහකාර දිවිනැගුම අධ්‍යක්ෂගේ ගිණුම වෙත නිදහස් කරනු ඇත.

**06.** මෙම වැඩසටහන පිළිබඳව හා එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව මේ සඳහා සුදුසුකම් ලැබූ සියලුම ප්‍රතිලාභීන්ව විධිමත් පරිදි නිරන්තරයෙන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දිවිනැගුම සංවර්ධන නිලධාරීන් වෙත ලබා දිය යුතුය. එමෙන්ම, එම නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි ප්‍රතිලාභියා දැනුවත් කර ඇත්ද යන්නත් ගිණුම් විවෘත කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම ප්‍රමාණවත් පරිදි ලබා දෙන්නේද යන්නත් ඔබගේ විශේෂ අවධානයට ලක්කිරීම වැදගත් වේ. විශේෂයෙන් ප්‍රතිලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි කටයුතු කිරීමට, නිලධාරීන් දැනුවත් කළ යුතුය.

## 07. වාර්තා සකස් කිරීම.

| | ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කළයුතු නිලධාරීන් | ක්‍රියාත්මක කළයුතු දින වකවානු |
|---|---|---|---|
| 01 | ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් දිවිනැගුම සහනාධාර දීමනා බැංකු උපරිම වාර්තාව පිළියෙල කිරීම(ඇමුණුම 01) | ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරි | සෑම මාසයකම වාර්තාව 05 දිනට පෙර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත ලබාදිය යුතුය. |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ සහනාධාර උපරිම වාර්තාව පිළියෙල කිරීම (ඇමුණුම02) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව 10 දිනට පෙර කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදිය යුතුය. |
| 03 | කලාප මට්ටමෙන් මාසික සහනාධාර උපරිම වාර්තාව ලබාදීම (ඇමුණුම 03) | කලාප ප්‍රධාන ගණකාධිකාරි | සෑම මාසයකම වාර්තාව 15 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ සමාජ සුභසාධන අංශය වෙත ලබාදිය යුතුය. |
| 04 | මාසික සමස්ත උපරිම වාර්තා පදනම් කරගෙන කලාප කාර්යාල වෙත මුදල් නිදහස් කිරීම | ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය | සෑම මාසයකම වියදම් සඳහා අවශ්‍ය මුදල් මාසයේ 25 දිනට පෙර ලබාදිය යුතුය. |
| 05 | කලාප කාර්යාලය විසින් ප්‍රාදේශීය කාර්යාල මට්ටමේ ගිණුම්වලට මුදල් නිදහස් කිරීම | කලාප ප්‍රධාන ගණකාධිකාරි | සෑම මාසයකම මුදල මාසයේ 26 දිනට පෙර ලබාදිය යුතුය |
| 06 | සහනාධාර ගෙවීම් (ප්‍රතිලාභීන්ගේ ගිණුම්වල මුදල් තැන්පත් කිරීම) | ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරීන් | සෑම මාසයකම මුදල එම මාසයේ පළමු දෙදින තුළ තැන්පත්කල යුතුය |
| 07 | සහනාධාර මුදල් ප්‍රාදේශීය දිවිනැගුම කාර්යාල වෙත ගෙවීමේ ප්‍රගතිය (ඇමුණුම 04) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව එම මාසයේ 10 දිනට පෙර කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශය වෙත ලබාදිය යුතුය |

| | | | |
|---|---|---|---|
| 08 | සහනාධාර මුදල් ප්‍රතිලාභීන් වෙත ගෙවීමේ මාසික ප්‍රගතිය (ඇමුණුම 05) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව එම මාසයේ 15 දිනට පෙර කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශය ලබාදිය යුතුය |
| 09 | කලාප මට්ටමේ ගිණුම් වාර්තාව | කලාප ප්‍රධාන ගණකාධිකාරි | සෑම මාසයකම 20 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතුය |
| 10 | ප්‍රාදේශීය කාර්යාල මට්ටමේ ගෙවීම් කරන ලද මුදල් ආපසු භාරදීම | ප්‍රාදේශීය දිවිනැගුම නිලධාරින් | එම මාසයේ ලබාදුන් මුදලින් වියදම් නොකර ඉතිරි මුදල ඉදුරාම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත සෑම මාසයකම 15 දිනට පෙර (කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත) ලබාදිය යුතුය |
| 11 | කලාපය විසින් ගෙවීම් නොකර ඉතිරි මුදල් ප්‍රධාන කාර්යාලයවෙත ලබාදිය යුතුය | කලාප ප්‍රධාන ගණකාධිකාරි | සෑම මාසයකම 20 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත ලබාදිය යුතුය (අධ්‍යක්ෂ ජනරාල් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව |

08. 2015 ජනවාරි මස සිට සෑම මසකම පළමු සතිය තුළ සහනාධාර ගෙවීමට කටයුතු කලයුතු බැවින් ඉහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කර දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ සියලුම මුදල් නියමිත දින වකවානුවල ලබාදීම සඳහා ඔබේ කාරුණික අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

09. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ ලබා දෙන සහයෝගය ඉතා අගය කරමි.

ආර්.ඒ.ඒ.කේ.රණවක.

අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත්-

1. සියලුම ප්‍රාදේශීය සංවර්ධන කමිටු ගරු සභාපතිතුමන්ලා, - කරු.දැ.පි.
2. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.පි.
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.පි.
4. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.පි.
5. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.පි.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කරු.දැ.පි.
7. .අයවැය අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.පි.
8. අධ්‍යක්ෂ ජනරාල්(භාණ්ඩාගාර මෙහෙයුම්) - කරු.දැ.පි.
9. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු.දැ.පි.
10. දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කරු.දැ.පි. හා අ.ක.ස.

**ඇමුණුම අංක 01**

**දිවිනැගුම සහනාධාර දීමනා බැංකු උපරිම වාර්තාව.**

2015 ……………………………………………… මාසය

දිස්ත්‍රික්කය :-…………………………

ප්‍රාදේශීය දිවිනැගුම කාර්යාලය :-……………………………………

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ නම :-……………………………………

| වසමේ නම | අදාළ දීමනා වර්ගයට අයත් ප්‍රතිලාභීන් ගණන | | | | මුළු ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|
| | 3000/= | 2000/= | 1000/= | 420= | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

සකස් කළේ :-………………………………………………

විෂය භාර කළමණාකරණ සහකාර

වසම් උපරිමය අනුව ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

පරීක්ෂා කළේ - ……………………………………

නිවැරදි බවට සහතික කරමි

ප්‍රාදේශීය සහකාර දිවිනැගුම අධ්‍යක්ෂ :- ……………………………………………

**ඇමුණුම අංක 02**

**දිවිනැගුම සහනාධාර දීමනා දිස්ත්‍රික් උපරිම වාර්තාව.**

2015 ........................................................ මාසය

දිස්ත්‍රික්කය :-................................

| ප්‍රාදේශිය කාර්යාලයේ නම | දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | අදාළ දීමනා වර්ගයට අයත් ප්‍රතිලාභීන් ගණන | | | | මුළු ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | 3000/= | 2000/= | 1000/= | 420/= | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

සකස් කළේ :-.......................................................

විෂය භාර කළමණාකරණ සහකාර

වසම් උපරිමය අනුව ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

පරීක්ෂා කළේ - ............................................

නිවැරදි බවට සහතික කරමි

දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ :- ..................................................

**ඇමුණුම 03**

**දිවිනැගුම සහනාධාර මුදල් ගෙවීමේ ප්‍රගතිය - කලාප වාර්තාව**

කලාපය :- අංක...........

මාසය :- ....................

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය දිවිනැගුම කාර්යාලය | අදාළ දීමනා වර්ගයට අයත් ප්‍රතිලාභීන් ගණන | | | | මුළු ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | 3000/= | 2000/= | 1000/= | 420/= | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

සකස් කළේ :- ....................

පරීක්ෂා කළේ :- ......................

නිවැරදි බව සහතික කරමි. ..............................

ඇමුණුම 04

| දිවිනැගුම සහනාධාර මුදල් ප්‍රාදේශිය දිවිනැගුම කාර්යාල වෙත ගෙවීමේ මාසික ප්‍රගතිය - දිස්ත්‍රික් වාර්තාව | | | | | |
|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය :- ............................. | | | | | |
| අනු අංකය | ප්‍රාදේශීය දිවිනැගුම කාර්යාලය | දිස්ත්‍රික් දිවිනැගුම කාර්යලයෙන් | | ශේෂය | |
| | | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් |
| උදා:- | | | | | |
| 1 | මිල්ලනිය | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |
| | | | | | |
| | | | | | |
| | එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |
| 2 | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |

සකස් කළේ :- ....................

පරීක්ෂා කළේ :- ......................

නිවැරදි බවට සහතික කරමි. ..................................

ඇමුණුම 05

| දිවිනැගුම සහනාධාර මුදල් ගෙවීමේ මාසික ප්‍රගතිය - දිස්ත්‍රික් වාර්තාව 2015........................අවසන් දිනට | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කලාපය :- ...................... | | | | | | | | |
| දිස්ත්‍රික්කය :- .............................. | | | | | | | | |
| අනු අංකය | ප්‍රාදේශීය දිවිනැගුම කාර්යාලය | දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | ප්‍රාදේශීය දිවිනැගුම | | දිවිනැගුම ප්‍රජාමූල | | ශේෂය | |
| | | | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් |
| උදා:- | | | | | | | | |
| 1 | මිල්ලනිය | ගල්පාත | | | | | | |
| | | හල්තොට | | | | | | |
| | | මිල්ලනිය | | | | | | |
| | | එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |
| 2 | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | මුලු එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |

සකස් කළේ :- .....................

පරීක්ෂා කළේ :- .......................

නිවැරදි බව සහතික කරමි. ...................................